ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My Ref. | CSS/7/1/3 | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2019.10. 14 |

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) :– 09/ 2019**

දකුණු පළාත් සභාවේ සියළුම ප්‍රධාන ගණන් දිමේ නිලධාරීන් හා
ගණන්දීමේ නිලධාරීන් වෙත,

**<u>රජයට අවශ්‍ය හදිසි සේවා ඉටු කිරිම වෙනුවෙන් ගාස්තු ගෙවීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කර ඇති 2016.01.08 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක : 01/2016 දරණ චක්‍රලේඛය හා 2019.07.22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ : 01/2016(i) අංක දරණ චක්‍රලේඛය හා බැඳේ. එම චක්‍රලේඛ පිටපත් මේ සමඟ ඉදිරිපත් කරමි.

02. ඉහත රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක:01/2016 හා 01/2016(i) දරණ චක්‍රලේඛ, දකුණු පළාත් සභාවට අදාල කර ගැනීමට , 2019.09.17 දිනැතිව ගරු ආණ්ඩුකාරතුමා අනුමැතිය ලබා දී ඇත.

03. 2016.01.08 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 01/2016 දරණ චක්‍රලේඛය මඟින් රජයට අවශ්‍ය හදිසි සේවා ඉටු කිරිම වෙනුවෙන් ගාස්තු ගෙවීම සඳහා අදාල උපදෙස් රාජ්‍ය ආයතන ප්‍රධානීන් වෙත නිකුත් කර ඇත.

04.2019.07.22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2016(i) දරණ චක්‍රලේඛය මඟින් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2016 දරණ චක්‍රලේඛයේ අංක 03 හි පමණක් සංශෝධනය කර , අනෙකුත් සියළු විධිවිධාන එලෙසින්ම බලපැවැත්වෙන බවත්, අංක 01/2016(i) දරණ චක්‍රලේඛයේ විධිවිධාන 2019.07.30 වන දින සිට අදාල කර ගත යුතු බවත් දන්වා ඇත.

05. ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 1.2 වගන්තියේ රාජ්‍ය නිලධාරීන් විසින් රජයට සේවා ඉටු කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සළස්වා ඇති අතර එය රාජ්‍ය සේවයෙන් පරිබාහිර පුද්ගලයින්ගෙන් ලබා ගන්නා සේවාවන් සඳහා අදාල නොවේ.

06. ඒ අනුව රජයට අත්‍යාවශ්‍ය හදිසි සේවාවන් සපයා ගනු පිණිස, තම ආයතනය තුල හෝ රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතන තුල සුදුසු පුද්ගලයකු නොමැති බව, දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් පෞද්ගලිකව සෑහීමකට පත් වන්නේ නම් ඒ සඳහා බාහිර පුද්ගලයකු/පුද්ගලයින් කණ්ඩායමක ගේ සේවය ලබාගත හැකිය.එබැවින් ඉහත ආකාරයේ සේවාවක් තම ආයතනයට ලබා ගැනීමට අදාල ඉල්ලීම සිදු කරනු ලැබීමට පෙර එම සේවාව තම ආයතනයට අත්‍යාවශ්‍ය හා හදිසි සේවාවක් බවට එම ආයතනය භාර ප්‍රධාන ගණන්දීමේ නිලධරියා ද පෞද්ගලිකව සෑහීමකට පත්වී , අදාල ඉල්ලීම සමඟ තම නිර්දේශය ද ඉදිරිපත් කළ යුතුය.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන ලේකම්<br>பிரதான செயலாளர்<br>Chief Secretary | 091 2232343 | කාර්යාලය<br>காரியாலயம்<br>Office | 091 2234052<br>091 2226118 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 091 2246299 | විද්‍යුත් තැපෑල<br>மின் அஞ்சல்<br>E-mail | chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය<br>இ தளம்<br>Web site | www.cs.sp.gov.lk |

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"විශිෂ්ටත්වයෙන් (1) ට එන යහපාලනයක්"

07.රජයේ තනතුරක නැවත සේවයේ යොදවා ඇති හෝ තාවකාලික පදනමකින් රජයේ ආයතනයක සේවයක් සිදු කරන විශ්‍රාමික රජයේ නිලධාරින් හැර විශ්‍රාමික රජයේ නිලධාරින්ගේ සේවයද මේ සඳහා ලබා ගත හැකිය.

08.2019.09.17 දිනෙන් පසුව ඉටු කර ගනු ලබන ඉහත විධිවිධානයන්ට අනුකූල කාර්යන්ට අදාල, ගෙවීම් දින 90ක් නොඉක්මවන්නා වූ කෙටිකාලීන පදනමක් මත ලබා ගත යුතු හදිසි සේවාවන් සඳහා පමණක් සීමා විය යුතු අතර එබඳු සේවාවක් සඳහා බාහිර පුද්ගලයකු/පුද්ගලයින් කණ්ඩායමකට හෝ විශ්‍රාමික රජයේ නිලධාරින්ට ගෙවිය හැකි උපරිම මුදල රු.150,000/- කි.

09.ඉහත අංක 08 හි ගෙවීම් සඳහා අත්තිකාරම් මුදල් නොගෙවිය යුතු අතර ගෙවීම් කළ යුත්තේ අදාල කාර්ය ඉටු කළ පසුව, එම කාර්ය විධිමත් පරිදි ඉටු කර ගත් බවට,අදාල සේවාව ඉටුකර ගත් ආයතන ප්‍රධානියාගේ සහතිකයක් හා එම ආයතනය භාර ප්‍රධාන ගණන්දීමේ නිලධරියාගේ නිර්දේශය ද සමඟ දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මතවේ.

10.ඉහත අංක 06,07 සහ 08 හි පරිදි අදාල සේවාව පැවරීමට පෙර සේවාව ලබා ගන්නා ආයතනය විසින් අපේක්ෂිත කාර්යභාරය පැහැදිලිව හඳුනා ගෙන සේවය සපයන්නා වෙත දැන්විය යුතුය.

11.ඉහත අංක 08 හි සීමාවන් ඉක්ම වන අවස්ථා වලදී එම වෙනස් වීම් වලට හේතු වූ කරුණු පැහැදිලි කරමින්,ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ නිර්දේශ සහිත ඉල්ලීමක්,මහා භාණ්ඩාගාරයේ අනුමැතියට යොමු කිරීම සඳහා, දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

12. ඒ අනුව මෙම චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කරන ලෙසටත් , මෙම චක්‍රලේඛය පිළිබඳව ඔබ යටතේ ඇති ආයතන දැනුවත් කරන ලෙසටත් කාරුණිකව දන්වා සිටිමි.

**ආර්.සී.ද සොයිසා,**
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත්:-

1. සහකාර විගණකාධිපති- දකුණු පළාත - දැ:ගැ:ස
2. නියෝජ්‍ය ප්‍රධාන ලේකම්
   (පාලන/ මුදල්/ සැලසුම්/ පිරිස් හා පුහුණු /ඉංජිනේරු සේවා ) - දැ:ගැ:ස
3. දකුණු පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ - දැ:ගැ:ස
4. ප්‍රධාන ගණකාධිකාරී - දැ:ගැ:ස

# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PFD/RED/06/CIR/2016/01
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2016.01. 08

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 01/2016

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

<u>රජයට අවශ්‍ය හදිසි සේවා ඉටුකිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම.</u>

ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 1.2 වගන්තියෙහි රාජ්‍ය නිලධාරීන් විසින් රජයට සේවා ඉටුකිරීම සම්බන්ධයෙන් විධි විධාන සළස්වා ඇති අතර එය රාජ්‍ය සේවයෙන් පරිබාහිර පුද්ගලයන්ගෙන් ලබාගන්නා සේවාවන් සඳහා අදාල නොවේ.

02. රජයට අවශ්‍ය හදිසි සේවාවන් සපයා ගනු පිණිස තම අමාත්‍යාංශය තුල හෝ රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතන තුල සුදුසු පුද්ගලයකු නොමැති බවට අමාත්‍යාංශ ලේකම් පෞද්ගලිකව සෑහීමකට පත්වන්නේ නම් ඒ සඳහා බාහිර පුද්ගලයෙකු/පුද්ගලයන් කණ්ඩායමකගේ සේවය ලබා ගත හැකිය. රජයේ තනතුරක නැවත සේවයේ යොදවා ඇති හෝ තාවකාලික පදනමකින් රජයේ ආයතනයක සේවයක් සිදු කරන විශ්‍රාමික රජයේ නිලධාරීන් හැර විශ්‍රාමික රජයේ නිලධාරීන්ගේ සේවය ද මේ සඳහා ලබාගත හැකිය.

03. මෙවැනි ගෙවීම් දින 60ක් නොඉක්මවන්නා වූ කෙටිකාලීන පදනමක් මත ලබාගත යුතු හදිසි සේවාවන් සඳහා පමණක් සීමා විය යුතු අතර එබදු සේවාවක් සඳහා බාහිර පුද්ගලයෙකු/පුද්ගලයන් කණ්ඩායමකට හෝ විශ්‍රාමික රජයේ නිලධාරීන්ට ගෙවිය හැකි උපරිම මුදල රු.60,000/= කි. මේ සඳහා අත්තිකාරම් මුදල් නොගෙවිය යුතු අතර ගෙවීම් කළ යුත්තේ අදාල කාර්යය ඉටු කළ පසුව අමාත්‍යාංශ ලේකම්ගේ පෞද්ගලික අනුමැතිය මත වේ.

04. ඉහත 02 හා 03 පරිදි අදාල සේවාව පැවරීමට පෙර සේවාව ලබාගන්නා ආයතනය විසින් අපේක්ෂිත කාර්ය භාරය (Terms of Reference) පැහැදිලිව හඳුනා ගෙන සේවය සපයන්නා වෙත දැන්විය යුතු ය.

05. ඉහත 03 සඳහන් සීමාවන් ඉක්මවන අවස්ථා වලදී එම වෙනස්වීම් වලට හේතු වූ කරුණු පැහැදිලි කරමින් ගණන්දීමේ නිලධාරියාගේ සහ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශ සහිත ඉල්ලීමක් මහා භාණ්ඩාගාර අනුමැතිය සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු ය. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් එසේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධව භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගෙන්/ භාණ්ඩාගාරයේ ලේකම්වරයාගෙන් අනුමැතිය ලබාගනු ඇත.

# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව

செயலகம், கொழும்பு 01.
இலங்கை

The Secretariat, Colombo 01.
Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700

ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823

වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PFD/RED/CIR/2019/03

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2019.07. 22

රාජ්‍ය මුදල් චක්‍රලේඛ : 01/2016 (i)

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

**රජයට අවශ්‍ය හදිසි සේවා ඉටුකිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම**

යථෝක්ත කරුණට අදාලව නිකුත් කරන ලද 2016.01.08 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2016හි 03 වන ඡේදය පහත පරිදි සංශෝධනය කෙරේ.

02. "මෙවැනි ගෙවීම් දින 90ක් නොඉක්මවන්නා වූ කෙටිකාලීන පදනමක් මත ලබාගත යුතු හදිසි සේවාවන් සඳහා පමණක් සීමා විය යුතු අතර එබඳු සේවාවක් සඳහා බාහිර පුද්ගලයෙකු / පුද්ගලයින් කණ්ඩායමකට හෝ විශ්‍රාමික රජයේ නිලධාරින්ට ගෙවිය හැකි උපරිම මුදල රු.150,000/- කි. මේ සඳහා අත්තිකාරම් මුදල් නොගෙවිය යුතු අතර ගෙවීම් කළ යුත්තේ අදාල කාර්යය ඉටු කළ පසුව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත වේ."

03. 2016.01.08 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2016හි ඇතුළත් අනෙකුත් විධිවිධාන එලෙසින්ම බලපැවැත්වෙන අතර මෙම චක්‍රලේඛය මගින් සංශෝධිත විධිවිධාන 2019.07.30 දින සිට අදාළ කරගත යුතු ය.

ආර්.එච්.එස්. සමරතුංග
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්: 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. ලේකම්, රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ හා ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය
05. විගණකාධිපති